**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම - 2022**

**------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ක්රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දැක්වෙන රු.12,430,943 ක් වූ තොග, ධාරණ අගය රු.205,575ක් වූ ස්ථාවර වත්කම් සහ රු.173,727ක්වූ අත ඉතිරි මුදල් භෞතිකව පවතින්නේද යන්න පිළිබඳව ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ජංගම වත්කම් යටතේ දැක්වෙන තොග, ස්ථාවර වත්කම් සහ අත ඉතිරි මුදල් භෞතිකව නොපවතී. මෙම වත්කම් මෙම ආයතනය Hambantota International Port Group Ltd. (HIPG) සහ Hambantota International Port Services Ltd. (HIPS) යන ආයතන වලට පැවරීමේදී වරාය අධිකාරියට සහ එම ආයතන වලට එම තොග සහ ස්ථාවර වත්කම් පවරා ඇත. එබැවින් මේවා භෞතිකව නොපවතී. | වගකිව යුතු නිලධාරින් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය රු.7,602,406,852ක්වූ අතර එදිනට සමාගමේ ශුද්ධ වත්කම් රු.7,527,406,852 ක සෘණ අගයක් විය. එසේම සමාගමේ මුලු ජංගම වත්කම් රු.2,099,760,231ක්වූ අතර සමාගමේ ගෙවිය යුතු ණය ශේෂය රු.9,627,167,082ක් විය. ඒ අනුව සමාගමේ ජංගම වත්කම්වලට වඩා ගෙවිය යුතු ණය ශේෂය සියයට 458ක් ඉක්මවා තිබීම හේතුවෙන් මෙම ණය මුදල ගෙවීමට සමාගමට ඇති හැකියාව අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒසේම සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින සිට නතර කර සමාගම ඈවර කිරීම සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් 2018 පෙබරවාරි 15 දින තීරණය කර තිබූ අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය 2021 මැයි 31 දින ලබා දී තිබුණි. එහෙත් 2023 පෙබරවාරි 02 දින දක්වාම ඈවරකරුවෙකු පත්කර ගැනීමට නොහැකිවී තිබුණි. | මෙම සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා 2017,2018 කාලවලදී කටයුතු සිදු කළද , එම කටයුතු නිසි පරිදි සිදු නොකිරීම මත 2020 ජූලි මස නව අධ්‍යක්ෂ මණ්ඩලයක් මාගම්පුර කළමනාකරණ (පුද්ගලික) සමාගම වෙනුවෙන් පත්කරන ලද බවත්, ඒ අනුව මෙම සමාගම පිහිටුවීමේ දී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව ඇති කරන ලද සමාගමක් බවත්, ඒ අනුව, සමාගම ගණන් බේරා වසා දැමීමේ කටයුතු සඳහාද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බවත්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු නිසි පරිදි සහ නීතියට අනුව කටයුතු කරමින් සමාගම වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරුන්ගේ උපදෙස් මත කටයුතු කල බවත්, ඒ අනුව 2021/12/10 දින කොළඹ වාණිජ මහාධිකරණයේ CHC/97/21 CO දරණ නඩු අංකය යටතේ, මෙම සමාගම ගණන් බේරා වසා දැමීමට අදාළ නඩුව ගොනු කර ඇති බවත් 2020 ජූලි මස නව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමෙන් පසු කිසිදු ප්‍රමාදයකින් තොරව මෙම නඩු කටයුත්ත සඳහා ගත යුතු සෑම ක්‍රියාමාර්ගයක්ම සමාගම වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරුන්ගේ උපදෙස් මත සිදු කර ඇති බවත් කාරුණිකව දන්වමි. | සමාගම ඈවර කිරීමට තීරණය කර ඇති බැවින් එය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු නිලධාරීන් ක්‍රියාකල යුතු බව . |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| හැටන් නැෂනල් බැංකුණය ශේෂය | 9,617,942,991 | ශේෂ සනාථන ලිපි | සමාගම විසින් 2022 වසරේදී ණය මුදලේ ශේෂය සනාථ කර ගැනීම සඳහා ශේෂ සනාථන ලිපියක් අදාළ බැංකුව වෙත යැවූවද ආයතනය සමග පවතින නඩු කටයුත්ත හේතුවෙන් ශේෂය සනාථ කළ නොහැකි බව වාචිකව දන්වන ලදී. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශේෂ තහවුරු කිරීම් ඉල්ලුම් කර ලබා ගත යුතු බව. |
| රජයෙන් ලැබිය යුතු ශේෂය | 17,782,563 | මූලාශ්‍ර ලේඛන, ශේෂ සනාථන ලිපි,වයස් විශ්ලේෂණ වාර්තා සහ උපකාරක ලියවිලි | 2019.08.16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි රු.17,182,563 ක් වන රජයෙන් ලැබිය යුතු ප්‍රමාණයත් රු.12,430,943ක් වන තොග කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා ලේකම්, වරාය හා නාවික අමාත්‍යංශය වෙත ඉල්ලීමක් කිරීමට තීරණය කරන ලදී. එම තීරණයට අනුව 2019.10.30 දින ලේකම්තුමා මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට මෙම ශේෂයන් කපා හැරීම පිළිබඳ ලිපියක් යොමු කරන ලදී. මේ පිළිබඳව එවකට සිටි ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ අප ආයතනයේ නිලධාරින්ද කැඳවා දීර්ඝ සාකච්ඡාවක් ද පවත්වන ලදී. නමුත් කිසිදු ලිඛිත පිළිතුරක් මේ වන තෙක් ලැබී නොමැත. තවද, මෙම ලැබිය යුතු ශේෂයන් පිළිබඳව ලිඛිතව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් තරම් ලියවිලි ආයතනය සතුව වර්තමානයේ නොපවතී. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශේෂ තහවුරු කිරීම් ඉල්ලුම් කර ලබා ගත යුතු බව සහ අනෙකුත් අදාල සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. |
| නැව්තෙල් රක්ෂණය වෙනුවෙන් ලැබිය යුතු ශේෂය | 28,040,453 | | | |
| වෙළඳ ණයගැතියන් ගෙන් ලැබිය යුතු ශේෂය | 3,589,879 | | | |
| ගෙවිය යුතු අනිකුත් දෑ වලට අදාළ ශේෂය | 6,842,977 | | | |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය | 4,301,292 | මූලාශ්‍ර ලේඛන, ශේෂ සනාථන ලිපි | එම රු.4,301,292 කට අදාල බදු සහතිකපත් 2018 වසරට පෙර ඒවා වන අතර ඒවා ලබා ගැනීමට නොහැකි බව අදාළ මූල්‍ය ආයතන වලින් දන්වන ලදී. | අදාළ මූලික සාක්ෂි ලිපි ලේඛණ ඉදිරිපත් කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාකර අවසානවිසඳුමකට පැමිණිය යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමෙන් අධිකාරියට ලැබිය යුතු ශේෂය ලෙස රු.5,800,921 ක් දක්වා තිබුණද, සමාගමේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත ශේෂය ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණද ඒ පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කළමණාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | එවැනි රු.5,800,921 ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ගෙවිය යුතු බවට කිසිඳු සාක්ෂියක් අප සමාගමේ පොත්වල 2007 වසරේ සිට සටහන් වී නොමැත. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා කොට අදාළ මුදල ගෙවිය යුතු ශේෂයක් නම් එය සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීමට කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම බව. |
| (ආ) | ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ කාල පරිච්ඡේදයන් තුළදී නිරවුල් කළ යුතු වුවද, 2017 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.2,381,117 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු ශේෂය, රු.794,047 ක්වූ එකතු කල අගය මත ගෙවිය යුතු බදු ශේෂය හා ගෙවිය යුතු රු.223,032 ක්වූ සේවක අර්ථසාධක සහ භාරකාර අරමුදලට දායක මුදල් ශේෂය යන ශේෂයන් නිරවුල් කිරීමට සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් 2017 වසරට පෙර සිටම පැවත එන ශේෂයන් වන අතර ඒවා නිරවුල් කිරීමට අදාල කිසිඳු මූලාශ්‍ර ලේඛනයක් සොයා ගැනීමට 2019 වසරෙන් පසුව නොහැකි වී ඇත. | ආදායම් බදු ශේෂය හා අනෙකුත් ශේෂ නිරවුල් කිරීමට කළමනාකරණය විසින් ක්‍රියා කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති හා අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය හා නැවත තහවුරු කරන ලද, පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක 03/2015 චක්‍රලේඛයෙහි 2.2 වගන්තිය | චක්‍රලේඛයට අනුව සමාගම “F” කාණ්ඩය යටතට ගැනෙන අතර එහි 2.2 ඡේදය ප්‍රකාරව සමාගමේ සභාපතිවරයා සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ මාසික දීමනා සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගත යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස සභාපතිවරයා සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයා වෙනුවෙන් මාසික දීමනා ලෙස | 2019 සහ 2020 වසර වලදී ද ආයතනය ආරම්භයේ සිටම එනම් 2013 වසරේ පමණ සිට පැවති ක්‍රමවේදය අනුගමනය කරමින් පොදු ව්‍යාපාර චක්‍රලේඛ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සභාපති වරයාට රු.100,000ක් සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයාට රු.90,000 බැගින් ගෙවන ලදී. තවද ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද 2020 ජනවාරි 13 දිනැති චක්‍රලේඛ අංක PS/SP/Circular/02/ 2020, මගින් සභාපති වරයාට රු.100,000 ක මාසික දීමනාවකුත් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා රු.25,000 ක උපරිම මාසික දීමනාවකුත් ලබා | විධිමත් අනුමැතියකින් තොරව ගෙවන ලද මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු බව. |

| | |
|---|---|
| පිළිවෙලින් රු.100,000 ක් හා රු.90,000ක් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් පිළිවෙලින් රු.1,100,000 ක් හා රු.990,000ක් ගෙවා තිබුණි. | දීමට අනුමැතිය ලැබී ඇත. මෙම දීමනාව ලබා ගැනීම සහ තම පෞද්ගලික වාහන රාජකාරි කටයුතු වලට භාවිතා කිරීම සඳහා ගන්නා දීමනාව වන රු.50,000 පිළිබඳව ද අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,914,050,233ක අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු. 441,980,579ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,356,030,812 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් රු. 3,484,075,886ක විදේශ විනිමය පරිවර්තන අලාභය හේතු වී තිබුණු අතර ශ්‍රී ලංකා රජය මගින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින අවසන් කර තිබීම මත මෙහෙයුම් ආදායම් නොමැතිවීම හා ණය මත පොළිය, තවදුරටත් අලාභයක් ව පැවතීම ට හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | **2022** **(රු)** | **2021** **(රු)** |
|---|---|---|
| ආදායම | - | - |
| ඍජු වියදම් | - | - |
| පරිපාලන වියදම් | (5,540,594) | (9,202,863) |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | (5,540,594) | (9,202,863) |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | (424,433,752) | (143,947,702) |
| විදේශවිනිමය ලාභය/(අලාභය) | (3,484,075,886) | (288,830,015) |
| බදු පෙර ශුද්ධ ලාභය | (3,914,050,233) | (441,980,579) |
| ආදායම් බදු | - | - |
| බදු පසු ශුද්ධ ලාභය | (3,914,050,233) | (441,980,579) |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින අවසන් කර තිබීම හේතුවෙන් 2021 හා 2022 වර්ෂයන් තුල මෙහෙයුම් කටයුතු වලින් සමාගමට ආදායම් ලැබී නොතිබුණි.

ii. 2021 වර්ෂයේදී රු.288,830,015 ක් වූ විදේශ විනිමය අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.3,484,075,886 ක් දක්වා සියයට 1,106 කින් වැඩි වී තිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම් රු. 5,540,594ක් වූ අතර ඒ තුල අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමණාකරුවන් දෙදෙනෙකුට ගෙවූ දීමනා ලෙස රු. 4,299,000ක් ඇතුලත්ව තිබුණි. එය පරිපාලන වියදම්හි ප්‍රතිශතයක් ලෙස සියයට 77ක් විය.

## 2.3. අනුපාත විශ්ලේෂණය

| | 2022 | 2021 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 0.218:1 | 0.278:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.216:1 | 0.276:1 |

2021 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 0.278:1 සහ 0.276:1ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය පිළිවෙලින් 0.218:1ක් සහ 0.216:1ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මෙහෙයුම් කටයුතු ඇවර කිරිමට 2018 පෙබරවාරි මස 15 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණු නමුත්, 2022 දෙසැම්බර් 31 දිනවන විට වසර 04 ක් ගතවී ඇතත් ඇවරකිරීමේ කටයුතු නිම වී නොතිබුණු අතර අක්‍රීයව පවතින මෙම සමාගම ඇවරකිරීමේ කටයුතුවල කාල ප්‍රමාදය හේතුවෙන් 2019 සිට 2022 වර්ෂය දක්වා පරිපාලන වියදම් ලෙස රු.31,983,639 ක පමණ මුදලක් දරා ඇති බව නිරීක්ෂණය විය. තවද, 2022 ජනවාරි සිට නොවැම්බර් දක්වා මාසික වැටුප ලෙස රු.50,000 බැගින් අර්ධ කාලීන මූල්‍ය කලමනාකරුවන් දෙදෙනෙකු සඳහා රු.1,100,000 ක් දරා ඇති බව නිරීක්ෂණය වූ අතර සමාගමේ ගනුදෙනු සිදුනොවන තත්ත්වයක් තුළ එසේ මුල්‍ය කලමනාකරුවන් දෙදෙනෙකු සේවයේ යෙදවීමේ අවශ්‍යතාවය සාධාරණය වන ලිඛිත තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවුණි. | අර්ධ කාලීන මූල්‍ය කළමනාකරුවන් දෙදෙනාගේ පත්කිරීමට අදාළ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අනුව කළමනාකරුවන් දෙදෙනෙකු සේවයේ යෙදවීමේ අවශ්‍යතාවය පැහැදිලිව තහවුරු කර ඇත. | කලමණාකරණය විසින් ගන්නා තීරණ ඵලදායී හා සාධාරණ විය යුතු බව. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී සමාගමේ සේවකයන් වන්දි ගෙවා ඉවත් කිරීමේදී ඇති වූ ආරවුල් සහගත තත්ත්වය කොළඹ කාර්මික අධිකරණයේ, කාර්මික බේරුම්කරණ අංක A/37/ 2017 දරන තීරණය සහ 2018 පෙබරවාරි 02 දින පාර්ශවකරුවන් අතර ඇති කර ගන්නා ලද සමථ කොන්දේසිවලට එකඟ වීම මත අවසන් කර තිබුණි. ඒ අනුව 2017 නොවැම්බර් මාසය සඳහා හිඟ අතිකාල දීමනා සහ/හෝ 2018 ජනවාරි දක්වා හිඟ වැටුප් ගෙවිය යුතුව ඇත්නම්, එම ගෙවීම් පමණක් 2018 පෙබරවාරි 28 වන දිනට පෙර ගෙවා නිම කළ යුතු බවට එකඟ වී තිබුණි. සමාගම විසින් එම එකග වූ කොන්දේසිවලට පටහැනිව සමාගමේ මෙහෙයුම් අක්‍රියව පැවති 2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි මාසයන්ට අදාලව ගමන් වියදම්, නවාතැන් දීමනා, කාර්යසාධන දීමනා හා වාහන දීමනා ලෙස රු.12,211,073 ක්වූ වෙනත් දීමනාවන් සේවකයන් වෙත ගෙවා තිබුණි. මේ පිළිබඳව 2017, 2018, 2019,2020 සහ 2021 වර්ෂවල විගණන වාර්තා මගින්ද පෙන්වා දී තිබූ නමුත් වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | එවකට සිටි මූල්‍ය කළමනාකරු විසින් එවකට ගන්නා ලද එම අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතීන්ට අදාළව එම ගෙවීම් සිදු කොට ඇති බවට අප හට දැනුම් දෙන ලදී. | වන්දි මුදල් ගෙවීමේදී සමථ කොන්දේසි අනුව කටයුතු කල යුතුය. එම කොන්දේසිවලට පටහැනිව යම් ගෙවීමක් සිදු කර ඇත්නම් අදාල ගෙවීම්වලට වගකිවයුතු නිලධාරීන්ගෙන් ඒවා ආපසු අය කර ගැනිමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන අත්පොත හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණු අනුව ප්‍රසම්පාදනයකදී වඩාත් යහපත් වූ විනිවිදභාවයක් හා මනා පරිපාලනයක් පැවතිම තහවුරු කිරීමට සමාගම වගබලා ගත යුතු වුවත්, සමාගම විසින් 2020 වර්ෂයේදී ආයතනයේ නීතිමය කටයුතු සඳහා පෙනී සිටි නීතිඥ සමාගමකට රු.7,250,000 ක මුදලක්ද, 2021 වර්ෂයේදී නීතිඥ සමාගම් වලට රු.3,005,000 ක් සහ 2022 වර්ෂයේදී රු.109,235 ක් නීති වියදම් ලෙස ගෙවා තිබුණ ද, එම නීතිඥයන් තෝරා ගැනීම සඳහා විනිවිදභාවයකින් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කරන ලද බවට තොරතුරු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම අදාළ නීති උපදේශක සමාගම සමඟ එළඹෙන ලද ගිවිසුම්ද විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | ආයතනයේ නීතිමය කටයුතු සඳහා පෙනී සිටි නීතිඥයින්ට කරන වියදම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා ඇත නව අධ්‍යක්ෂක මණ්ඩලය 2021 ජූලි මස අග භාගයේදී පත්වන ලදී. ඒ අවස්ථාවේ දී කොළඹ දිසා අධිකරණයේ පනවා ඇති DDR 1347/19 දරණ නඩුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදී. එම අවස්ථාවේදී එම නඩු වර්ගය ( DDR නඩුවක් වශයෙන්)යොමුකර ඇති බවත් ඉදිරි කැඳවීමේ දිනය ලෙස 2020.08.18 දින අධිකරණයේ කැඳවීමට නියම කර තිබුණි. මෙම නඩු වල විශේෂත්වය වන්නේ නඩුව කැඳවන ප්‍රථම දිනයේදීම විරෝධතා ගොනු කල යුතු බවයි.එසේ නොවුන හොත් ගරු අධිකරණය විසින් නඩුවේ ඉල්ලා ඇති බිලියන 4.4 මුදල සඳහා නෛසායි නීන්දු ප්‍රකාශය නියම කලහොත් සමාගම බරපතල අර්බුදයකට පත් වේ. මන්ද ඒ වන විටත් සමාගම සතුව තිබූ මුදල බිලියන 1.2 කට ආසන්න මුදලක් නිසාවෙනි . ඒ අනුව හැකි ඉක්මනින් ගරු අධිකරණය එකී විරෝධතා ගොනු කිරීමට අවශ්‍ය වූ නිසා ඒ සඳහා කාලයක් නොතිබූ බැවින් විශ්වාසවන්ත සහ හැකි ඉක්මනින් විරෝධතා සකස් කිරීම සඳහා නීතිඥ උපදෙස් ලබා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවක් වූ බැවින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට යටත්ව ඉහත නීතිඥවරුන්ගේ සහය ලබා ගන්නා ලදී. එහිදී නීතිඥවරුන් සඳහා නීතිඥ ගාස්තු මුදලින් ගෙවා ඇත්තේ සම්පූර්ණ නඩු කටයුත්ත සඳහා වේ. නැවත කිසිදු ගෙවීමක් මේ සඳහා සිදු නොකෙරේ. 2021 වර්ෂයේ ගෙවන ලද රු. 3,005,000 ආයතනය විසුරුවා හැරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට පත් කරන ලද නීතිඥයින් හට ගෙවන ලද නීතිඥ ගාස්තු වේ. එයද අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සහිතව තෝරා ගන්නා ලදී. | ප්‍රසම්පාදන කටයුතු වලදී විනිවිදභාවයකින් හා මනා පරිපාලනයකින් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කිරීම කළමනාකරණයේ වගකීම වේ. |